තොරතුරු මාසිකය

# විමර්ශන

**2024 අප්‍රේල්**
**ජනතා විමුක්ති පෙරමුණේ**
**අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.**

**ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!**

# සම්පත් විකිණීම සහ කළමනාකරණය

**ධනේශ්වර ආර්ථීක විද්‍යාවට අනුව සම්පත් වර්ග හතරකි. එය භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසාය ලෙස ප්‍රධාන කොටස් හතරකට බෙදා දැක්වේ. මාක්ස්වාදයේදී මෙය ශ්‍රමය, ශ්‍රම විෂය සහ ශ්‍රම මාධ්‍ය ලෙස වර්ග කර දැක්වේ. අප ජීවත්වන්නේ ධනේශ්වර ආර්ථීකයක නිසා මෙම ධනේශ්වර සංකල්ප ක්‍රියාත්මක වන ආකාරය විමසා බැලීම වටී. ඒ අනුව රාජ්‍ය සම්පත් යන්න වර්ග කළහොත්, ඉහත වර්ග හතරට අලුතෙන් එකතුවිය යුත්තේ, 'රාජ්‍ය' යන කොටස පමණි. එහෙත්, භූමිය නමැති සම්පත සහ ශ්‍රමය නමැති සම්පත පමණක් ගෙන සලකා බැලූ කල ඒවා විකුණන්නේ කෙසේද යන කාරණය වැදගත්ය. ධනේශ්වර ආර්ථීක විද්‍යාවට අනුව භූමිය යන්නට ස්වභාවධර්මයෙන් ලද සියලු දේ ඇතුළත් වේ. ඒ අනුව ඉඩම් පමණක් නොව ගහකොළ, සතුන්, ජලය වැනි සියලු ස්වාභාවික දේ භූමිය යටතට ගැනේ. මේ රාජ්‍ය සම්පත් විකිණීම යන තේමාවට මේ සියල්ල ඇතුළත් විය යුතුය. එයට රාජ්‍ය ආයතන පමණක් නොව සියලු ස්වාභාවික දේද ඇතුළත් විය යුතුය. ව්‍යාපාරික ආයතන පමණක් නොව ජල මූලාශ්‍ර පවා රාජ්‍ය සම්පත් ගණයට වැටේ.**

අනෙක් අතට ශ්‍රමය තුළ අන්තර්ගත වන්නේ වැඩිදියුණු කරගත් මානව හැකියාවයි. එය රාජ්‍යයේ දියුණුවට පාවිච්චි කරනවා වෙනුවට, භාණ්ඩ හා සේවා නිපදවනවා වෙනුවට ශ්‍රමය ලෙසම විකුණා දැමීමට අප වැනි රටවල් කටයුතු කරයි. මෙම භූමිය සහ ශ්‍රමය එක්කර එය ආර්ථික සංවර්ධනයට යොදා නොගෙන සරලවම විකුණා දැමෙයි. අපේ අද ආර්ථික අර්බුදයට ප්‍රධාන හේතුවක් වන්නේ මේ විකුණා දැමීමේ ප්‍රතිපත්තියයි. ඒ අතර ලාභ ලබා හෝ නොලබා සමාජ සුභසාධන භාණ්ඩ ලෙස අර්ථගැන්වෙන බොහෝ භාණ්ඩ හා සේවා රජය මැදිහත්වී ජනතාවට ලබාදිය යුත්තේ, ඒවා ජනතාවගේ එදිනෙදා ජීවිතයට ඉතා ප්‍රබල ලෙස බලපාන නිසාය. විදුලිය, ජලය, ඛනිජ තෙල්, සන්නිවේදන එවැනි උදාහරණ කිහිපයකි. දැනට පෞද්ගලිකකරණය කරන ලද ව්‍යාපාර ගණනාවක් ඇති අතර, සමහර ඒවා ලාභ ලබන අතර, සමහර ආයතන පාඩු ලබමින් තිබේ. එහෙත්, ඒවායින් ආර්ථිකයට සිදුවූ සෙතක් නම් නැත.

එසේ තිබියදී, ජලසම්පාදනය වැනි ආයතන පවා පෞද්ගලිකකරණය කිරීමට සූදානම් වීමේ යථාර්ථය හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. පහත වගුවෙන් දැක්වෙන්නේ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 2023 වසරේ ගිණුම් තොරතුරු කිහිපයකි.

ඉහත තොරතුරු අනුව මණ්ඩලයේ මුළු වියදමින් සියයට 23ක් දැරීමට සිදුවී ඇත්තේ, ලබා ගත් ණය වෙනුවෙන් පොලී ගෙවීම සඳහාය. තවත් සියයට 23ක් විදුලි බිල වෙනුවෙන් ගෙවීමට සිදුවී තිබේ. ඒ අනුව මුළු වියදමින් සියයට 46ක් ගෙවීමට සිදුව ඇත්තේ, රජයේ අකාර්යක්ෂමතාව වෙනුවෙන්ය. මණ්ඩලය ලබාගත් ණය යොදවා කරන ලද ව්‍යාපෘති සියයට 90ක් පමණ අසාර්ථක මට්ටමේ පවතිද්දී, ඒවාට ලබාගත් ණය වෙනුවෙන් මෙලෙස ණය පොලී ගෙවීමට සිදුවී තිබේ. අනෙක් අතට ඒවායේ සිදුවූ වංචා, දූෂණද ඉතා ඉහළය. ඒ අනුව ලංකාවේ ජල පාරිභෝගිකයෝ දිනපතාම රජයේ වංචා, දූෂණ, අකාර්යක්ෂමතා වෙනුවෙන් ගෙවමින් සිටිති.

| වියදම් වර්ගය | රු . මි. | මුළු වියදමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| විදුලි බලය | 13,857 | 23% |
| මූල්‍ය වියදම් (ණය පොලී) | 13,934 | 23% |
| සේවක පිරිවැය | 15,603 | 25% |
| අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු | 4,201 | 5% |
| රසායනික ද්‍රව්‍ය | 2,936 | 5% |
| ක්ෂය වීම් | 4,904 | 8% |
| අනෙකුත් පරිපාලන | 5,825 | 10% |

මෙම ආයතන මෙසේ පාඩු ලබන තත්ත්වයට පැමිණි කල ඊළඟ උපායමාර්ගය වන්නේ පෞද්ගලිකකරණය කිරීම හෝ විකුණා දැමීමයි. දැනටමත් ජලසම්පාදන මණ්ඩලය විකුණා දැමීමට පිඹුරුපත් සකසා අවසන්ය. තමන් නිපදවන භාණ්ඩයේ මූලික අමුද්‍රව්‍ය නොමිලේ ලැබෙන මෙවැනි ආයතනයකට ලාභ ලැබීමට හෝ අඩු මිලට ජලය දීමට නොහැකිවීම යනු වෙනම සාකච්ඡා කළයුතු කරුණකි.

ආයතන පෞද්ගලිකකරණය කිරීම (Privatization) සහ පෞද්ගලික අංශය යනු (Private Sector) යනු වෙනස් කතා දෙකකි. පෞද්ගලික අංශය දියුණු කිරීම රජයේ ප්‍රධාන ආර්ථික කටයුත්තක් වන අතර, රජයේ සම්පත් පෞද්ගලික අංශයට විකිණීම වෙනම කතාවකි. මෙම රාජ්‍ය දේපොළ විකුණා දැමීමේදී භාවිත කරනු ලබන ආයෝජන මොඩලය වන්නේ රාජ්‍ය, පෞද්ගලික හවුල් ව්‍යාපාර (PPP) නමයි. එහෙත්, ජාතික ජන බලවේගය මෙයට වෙනස් මොඩලයක් වන රාජ්‍ය, පෞද්ගලික, මහජන හවුල් ව්‍යාපාර (4P) මොඩලයක් හඳුන්වා දී ඇත්තේ, (ප්‍රතිපත්ති ප්‍රකාශය පිටුව 68) මෙම විකෘති කිරීම් ඉවත් කිරීම සඳහාය. අනෙක් අතට ව්‍යාපාර ආයතනයක් වසා දැමීමට බලපාන ප්‍රධාන කරුණු කිහිපයක් ඇත.

1. අදාළ භාණ්ඩයට වෙළෙඳපොළ ඉල්ලුමක් නොමැතිවීම.
2. ප්‍රමාණවත් ලාභ ලැබීමට නොහැකිවීම.
3. කළමනාකරණයේ දුර්වලතාවන්.
4. නෛතික හෝ පාරිසරික සාධක

බොහෝ රාජ්‍ය ආයතනවලට පාඩු ලැබීමට සිදුවී ඇත්තේ කළමනාකරණයේ ඇති දුර්වලතා සහ දූෂණ වංචා නිසා මිස අනෙකුත් කරුණු නිසා නොවේ. පෞද්ගලිකකරණය මගින් කරනු ලබන්නේ කළමනාකරණය වෙනස් කිරීමයි. එම නිසා කළ යුත්තේ, විකිණීම නොව දූෂණ හා වංචාවෙන් තොර විධිමත් ප්‍රතිපත්ති රාමුවක් තුල කළමනාකරණය කර පවත්වාගෙන යාමයි.

# ධනවාදයේ අර්බුදය හා ආර්ථික ජාතිකවාදය

**කලින් කලට ඇතිවන අධිනිෂ්පාදන ආර්ථික අර්බුද ධනපති ක්‍රමයට ආවේණික ලක්ෂණයකි. ප්‍රථම අධිනිෂ්පාදන ආර්ථික අර්බුදය ඇති වූයේ 1825 දී එංගලන්තයේය. ධනවාදය ලෝකයේ රටවල් ගණනාවක බිහි වී ජගත් ධනවාදී වෙළෙඳපොළක් ඇතිවූ සමයක එනම්, 1847 - 1848 අතර ප්‍රථම ලෝක ආර්ථික අර්බුදය ඇති විය. ඉන් පසු කලින් කලට ධනවාදී ලෝකය තුළ ආර්ථික අර්බුද හටගැනිණි. එය මාක්ස්වාදී ආර්ථික විද්‍යාව තුළ හඳුන්වන්නේ 'චක්‍රිය අර්බුද' ලෙසය. (ධනවාදයට ආවේණික සහ කලින් කලට ඇතිවන ආර්ථික අර්බුද ධනවාදී ආර්ථික විද්‍යාඥයන්ට ප්‍රතික්ෂේප කළ නොහැකි තත්ත්වයට පත් වී තිබේ. නමුත්, ඔවුන් එය හඳුන්වන්නේ ආර්ථික අර්බුද ලෙස නොව 'ව්‍යාපාරික චක්‍ර' ලෙසය.)**

මෙලෙස කලින් කලට ඇතිවන ධනවාදී අර්බුදයේ ප්‍රධාන ප්‍රතිවිරෝධය පවතින්නේ නිෂ්පාදනය තුළ වුවද, බැලූබැල්මට එය පෙනීසිටින්නේ ජනතාවගේ මිල දී ගැනීමේ හැකියාවේ සහ ආයෝජනවල අර්බුදයක් ලෙසය. එනම්, එය පෙනීසිටින්නේ සැබෑ හේතු පවතින නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ ගැටලුවක් ලෙස නොව සංසරණ ක්ෂේත්‍රය තුළ ගැටලුවක් ලෙසය. එබැවින්, ධනපති ආර්ථික විද්‍යාඥයෝ නිතරම අර්බුදයේ හරය තේරුම් නොගෙන පෙනුමෙහි මතුවන සාධකවලට ප්‍රතිකාර කිරීම හරහා අර්බුද ඇතිවීම වැළැක්වීමට උත්සාහ කරති. විශේෂයෙන්ම අධිරාජ්‍යවාදී යුගයේදී ධනවාදයේ චක්‍රීය අර්බුද වැළැක්වීමේ අරමුණ ඇතිව විවිධ ආර්ථික මොඩල ධනේශ්වර ආර්ථික විද්‍යාඥයන් විසින් හඳුන්වා දී තිබේ.

## කේන්සියානු ආර්ථික මොඩලය හෙවත් රාජ්‍ය සුභසාධන ධනවාදය

දෙවන ලෝක යුද්ධයෙන් පසු අධිරාජ්‍යවාදී රටවල් කේන්සියානු ආර්ථික මොඩලය අනුගමනය කිරීමට පෙළැඹුණේ 1929 මහා ආර්ථික අවපාතයේ අත්දැකීම් සහ සමාජවාදී කඳවුර විසින් ඇති කරන ලද බලපෑම හේතුවෙනි. මෙම ආර්ථික මොඩලය යෝජනා කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය ආර්ථික විද්‍යාඥ ජෝන් මෙනාඩ් කේන්ස් විසිනි. කේන්ස්ට අනුව ධනවාදී වෙළෙඳපොළ එය විසින්ම සමතුලනය වන්නේ නැත. සඵල ඉල්ලුම පවත්වා ගෙන යාම සඳහාත්, පූර්ණ රැකියා නියුක්තිය පවත්වාගෙන යාම සඳහාත්, 'ව්‍යාපාරික චක්‍රය' ස්ථාවර කර ගැනීම සඳහාත්, විශේෂයෙන් ආර්ථික අවපාතයකදී රජය මැදිහත්විය යුතුය. බදු ක්‍රියාවලිය, කාසි හා නෝට්ටු මුද්‍රණය, රාජ්‍ය වියදම් කළමනාකරණය හා රාජ්‍ය සුභසාධනය හරහා ආර්ථිකය රජය විසින් කළමනාකරණය කළ යුතුය.

එහෙත්, කේන්සියානු ආර්ථික මොඩලයට හෙවත් රාජ්‍ය සුභසාධන ධනවාදයට ධනපති ක්‍රමයට ආවේණික චක්‍රීය අර්බුද හට ගැනීම වැළැක්වීමට නොහැකි විය.

## නව ලිබරල්වාදී ආර්ථික මොඩලය

කේන්සියානු හෙවත් රාජ්‍ය සුබසාධන ආර්ථික මොඩලයේ අසාර්ථකත්වය නව ලිබරල්වාදයට මඟපෑදීය. නව ලිබරල්වාදය නමැති සංකල්පය ගොඩනැඟෙන්නේ 1970 දශකයේ මුල් කාලයේදීමය. එහිදී මූලිකත්වය ගත්තේ චිකාගෝ සරසවියේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ මිල්ටන් ෆ්‍රීඩ්මාන් (Milton Friedman) හා ෆ්‍රෙඩ්රික් හයැක් (Friedrich Hayek), බ්‍රිතාන්‍යයේ ආර්ථික කටයුතු පිළිබඳ ආයතනය සහ ඇඩම් ස්මිත් ආයතනයයි.

මෙම ආර්ථික ගුරුකුලය නිදහස් වෙළෙඳපොළ සහ එහි හැකියාව පිළිබඳව විශ්වාසය තැබූ අතර, පූර්ණ රැකියා නියුක්තිය ශ්‍රම වෙළෙඳපොළ විකෘති කරන බව පැවසීය. මුදල් සැපයීම තදින් පාලනය කළ යුතු බවත්, රාජ්‍ය වියදම් හා රාජ්‍ය ණය සීමා කළ යුතු බවත්, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය හා පෞද්ගලිකකරණය කළ යුතු බවත්, අඩු ආදායම්ලාභීන්ගෙන් පවා බදු අය කළ යුතු බවත් ප්‍රකාශ කර සිටියේය.

නව ලිබරල්වාදයේ ආරම්භක සහ දර්ශීය රට බවට පත්වූයේ චිලියයි. 1973 ජෙනරල් පිනෝචේගේ කුමන්ත්‍රණයෙන් පසු නව ලිබරල්වාදී ආර්ථික මොඩලය එරට තුළ ක්‍රියාත්මක කිරීමට පටන් ගත් අතර, නවලිබරල්වාදය එහි උච්චස්ථානයට පත්වූයේ ගෝලීයකරණ ක්‍රියාවලියේදීය. 2008 සැප්තැම්බර් මාසයේදී ඇතිවූ ලෝක මූල්‍ය අර්බුදය දක්වාම නවලිබරල්වාදී ආර්ථික මොඩලය දර්ශීය ආර්ථික මොඩලය බවට පත්ව තිබිණි.

## ආර්ථික ජාතිකවාදය


2008 සැප්තැම්බර් මාසයේදී ඇතිවූ ලෝක මූල්‍ය අර්බුදයෙන් පසු මේ වනවිට දශකයකට වැඩි කාලයක් ගතවී තිබේ. එම අර්බුදය සන්ධිස්ථානය ලෙස සලකුණු කර ගනිමින්, ආර්ථික ජාතිකවාදය ලෙස හැඳින්විය හැකි නව ආර්ථික මොඩලයක් හැඩගැසෙමින් පවතින අයුරු මේ වන විට නිරීක්ෂණය කළ හැකිව තිබේ. (එහෙත් එය නව ආර්ථික මොඩලයක් ලෙස හැඳින්විය හැක්කේ සාපේක්ෂ අර්ථයෙන් පමණි.)

## නව ලිබරල්වාදයේ සිට ආර්ථික ජාතිකවාදය දක්වා පල්ලම් බැසීමට හේතු වූ කරුණු


දශක හතරකට ආසන්න කාලයක් පැවැති නව ලිබරල්වාදී ආර්ථික මොඩලය තුළ ඇතිවූ වෙනස්කම් විසින් ධනවාදයට ආර්ථික ජාතිකවාදය දක්වා පල්ලම් බැසීමට සිදුවී තිබේ. එලෙස ඇතිවූ ප්‍රධාන වෙනස්කම් කිහිපයක් හඳුනාගත හැකිය.

1. ධනවාදයට ආවේණික චක්‍රීය අර්බුද පැනනැඟීම නැවැත්වීමට නව ලිබරල්වාදයට නොහැකි වීම.

(විශ්ලේෂණයන්ට අනුව, 2007-2008 ලෝක මූල්‍ය අර්බුදය හදිසියේ ඇති වුවද, එය දර්ශීය අධිනිෂ්පාදන අර්බුදයක්



ජෝන් මේනාඩ් කේන්ස්



මිල්ටන් ෆ්‍රීඩ්මාන්



ෆ්‍රෙඩ්රික් හයැක්

ලෙස සැලැකිය හැකි වේ. - රොබර්ට් ග්‍රිෆිත්, දේශපාලන ආර්ථික විද්‍යාව සහ කම්කරු ඉතිහාසය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය.)

2. ආර්ථික ගතිකත්වය කේන්ද්‍රීය අධිරාජ්‍යවාදී රටවල් වෙතින් ඉවතට යාම.

3. භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය කේන්ද්‍රීය අධිරාජ්‍යවාදී රටවල් වෙතින් ආර්ථික ගතිකත්වයක් ඇති නව මධ්‍යස්ථාන වෙත ( උදා: BRICS රටවල්වලට) මාරුවීම.

ආර්ථික ජාතිකවාදය යනු ප්‍රාග්ධනය, ශ්‍රමය සහ භාණ්ඩ සංචලනය සඳහා තීරු බදු ඇතුළු සීමා කිරීම් ඇති කිරීමේ ප්‍රතිපත්තිය හරහා ආර්ථිකය තුළ රාජ්‍ය මැදිහත්වීමට ප්‍රමුඛතාව ලබා දෙන දෘෂ්ටිවාදයකි. ආර්ථික ජාතිකවාදය මඟින් මූලිකව විශ්වාස කෙරෙන්නේ ආර්ථිකය ජාතිකවාදී ඉලක්කවලට සේවය කළ යුතු බවයි. එය ඒ ඒ රටෙහි දේශීය කර්මාන්තය ආරක්ෂා කිරීම, අපනයනය දිරිගැන්වීම වෙනුවෙන් පෙනීසිටින අතර, වෙළෙඳ බාධක, තීරු බදු සහන, විදේශීය ආයෝජනය සීමා කිරීම් හරහා විදේශීය තරගය පාලනය කරනු ලබයි.



ජෙනරල් ඔගස්ටෝ පිනෝචේ

| | නව ලිබරල්වාදය | | ආර්ථික ජාතිකවාදය | | කේන්සියානුවාදය |
|---|---|---|---|---|---|
| 1. | නිදහස් වෙළෙඳපොළ මූලධර්ම, අවම රාජ්‍ය මැදිහත්වීම, ප්‍රතිව්‍යුහගතකරණය, පෞද්ගලිකකරණය වෙනුවෙන් පෙනීසිටී. | 1. | තීරු බදු සහන සහ වෙළෙඳ බාධක හරහා දේශීය කර්මාන්ත ජාත්‍යන්තර වෙළෙඳපොළ තරගයෙන් රැකගැනීමට කටයුතු කරයි. | 1. | ආර්ථිකය හැසිරවීමට රජයේ මැදිහත්වීම දිරිගන්වයි. |
| 2. | ගෝලීයකරණය සහ නිදහස් වෙළෙඳ ගිවිසුම් වෙනුවෙන් පෙනීසිටී. | 2. | ගෝලීයකරණය වෙත අශුභවාදී ප්‍රවේශයකින් කටයුතු කරන අතර, ජාත්‍යන්තර සහයෝගීතාවලට වඩා දේශීය වුවමනාවලට ප්‍රමුඛතාව ලබා දේ. | 2. | සඵල ඉල්ලුම පාලනය සඳහා ආණ්ඩුවේ වියදම් පාලනය, බදු කප්පාදුව, මූල්‍ය ප්‍රතිපත්ති සැකැසීම සිදු කරයි. |
| 3. | මූල්‍ය නිදහස, මූල්‍ය වෙළෙඳපොළ ප්‍රතිව්‍යුහගතකරණය, ප්‍රාග්ධනයේ චලනය (ගලා යාම) දිරිගන්වයි. | 3. | ප්‍රාග්ධන පාලනය, දේශීය කර්මාන්ත රැකගැනීම සඳහා විදේශ ආයෝජන සීමා කිරීම දිරිගන්වයි. | 3. | පූර්ණ රැකියා නියුක්තිය, ස්ථාවර ආර්ථික වර්ධනය සඳහා රජය මැදිහත්වී සහන ලබා දේ. |
| 4. | රාජ්‍ය වියදම් කප්පාදුව වෙනුවෙන් පෙනීසිටී. බදු ගැසීම, මූල්‍ය විනය දිරිගන්වයි. | 4. | උපක්‍රමික කර්මාන්ත රැකගැනීමට, දේශීය නිෂ්පාදනයට සහාය පිණිස සහ ජාතික ආර්ථික ස්වාධීනත්වය වෙනුවෙන් රාජ්‍ය මැදිහත්වීම අපේක්ෂා කරයි. | | |

# මානව පරිණාමය පිළිබඳ නූතන

(පසුගිය කලාපය හා සම්බන්ධයි.)

වසර ලක්ෂ 7කට පමණ පෙර අප්‍රිකානු කලාපයේදී හෝමෝ අර්ගාස්ටර් (අප්‍රිකානු හෝමෝ ඉරෙක්ටස්) පරිණාමය වීම හරහා බිහිවන්නට ඇතැයි සැලැකෙන හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා අදින් වසර ලක්ෂ 2කට පමණ පෙර කාලයක මිහිමත වාසය කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.


### හෝමෝ හෙයිඩල්බජෙන්සිස් (Homo heidelbergensis)

1907දී ජර්මනියේ හෙයිඩල්බර්ග් හි කම්කරුවකු විසින් ප්‍රථම වරට මෙම විශේෂයට අයත් මානව පොසිලයක් සොයාගන්නා ලදී. මානව යටිහනුවක් වූ එම පොසිලය ජර්මනියෙන් සොයාගෙන ඇති හෝමෝ විශේෂයකට අයත් පැරැණිතම පොසිලයද වේ. හෝමෝ හෙයිඩල්බජෙන්සිස් යන නාමය මෙම මානව විශේෂයට යොදනු ලැබුවේද එම පොසිලය මුල්ම වරට සොයාගත් ප්‍රදේශය අනුවය. සමහර විද්‍යාඥයන් විසින් මුල්කාලීනව මෙය හෝමෝ ඉරෙක්ටස් උපවිශේෂයක් ලෙසටම සලකා හෝමෝ ඉරෙක්ටස් හෙයිඩල්බජෙන්සිස් ලෙස නම් කරනු ලැබුවද, 2015 සිට එය තවදුරටත් ඉරෙක්ටස් උපවිශේෂයක් ලෙස සලකනු නොලබන අතර, වෙනම මානව විශේෂයක් ලෙසටම සලකනු ලබයි.

එසේම ස්විට්සර්ලන්ත පතල්කරුවකු වූ ටොම් ස්විග්ලර් 1921දී සැම්බියාවේ දී සොයාගත් මානව පොසිලය තවත් නව මානව විශේෂයක් ලෙස හඳුන්වමින් හෝමෝ රොඩේශියන්සිස් ලෙස නම් කරන ලදී. පසුකාලීනව හෝමෝ රොඩේශියන්සිස් ලෙස නම් කළ මානව විශේෂයට අයත් පොසිල තව තවත් හමුවීමත් සමඟ සිදුකරන ලද පර්යේෂණ අනුව වර්තමානයේ එම විශේෂය වෙනම මානව විශේෂයක් නොව හෝමෝ හෙයිඩල්බජෙන්සිස් විශේෂය ලෙසටම සලකනු ලැබේ.

හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා බිහිවීම සම්බන්ධව දීර්ඝව සිදුකරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේදී විද්‍යාඥයන් විසින් සඳහන් කරනු ලැබුවේ මෙම මානවයා බිහිවීම සිදුව ඇත්තේ, අප්‍රිකානු කලාපය තුළදී බවයි. අප්‍රිකානු කලාපයේ විසූ හෝමෝ ඉරෙක්ටස් මානවයා (හෝමෝ අර්ගාස්ටර්) පරිණාමය වීම හරහා හෝමෝ හෙයිඩල්බජෙන්සිස් බිහිවූ බවත්, ඉන්පසු ඔවුන් අදින් වසර ලක්ෂ 5කට පමණ පෙර යුරෝපය පුරා පැතිර ගිය බවත් එම පර්යේෂණ අනුව ප්‍රකාශ කෙරිණි. එසේ බිහිවූ මෙම මානවයා සම්පූර්ණයෙන් වඳවී අවසන් වනු වෙනුවට වෙනත් විශේෂ බවට පරිණාමයවූ බව දැනට පිළිගත් මතය වේ.

හෝමෝ සේපියන් පරිණාමය වූයේ අප්‍රිකානු කලාපයේ යැයි විශ්වාස කෙරෙන බැවින්, අතීතයේ හෝමෝ රොඩේශියන්සිස් ලෙස නම් කිරීමට ලක්වූ අප්‍රිකානු කලාපයේ වාසය කළ හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයන් හරහා නූතන මානවයා පරිණාමය වන්නට ඇතැයි විශ්වාස කෙරේ. අදින් වසර 2,59,000ක් පමණ පැරැණි හෝමෝ හෙයිඩල්බජෙන්සිස්ද, එසේත් නැතිනම්




හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවය

හෝමෝ සේපියන්දැයි නිශ්චිතව කිව නොහැකි ලෙස අතරමැදි තත්ත්වයක පවතින, දකුණු අප්‍රිකාවේ ෆ්ලොරිස්බෑඩ් ප්‍රදේශයෙන් 1932දී සොයාගන්නා ලද මානව හිස්කබල එම මතය තවදුරටත් තහවුරු කරයි. (මෙම හිස්කබල අයත් මානව විශේෂය හෝමෝ හෙල්මෙයි ලෙසද නම් කර ඇත.) එසේම යුරෝපා කලාපය වාසභූමිය කරගත් හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයන් හරහා නියැන්ඩර්තාල් මානවයන් පරිණාමය වන්නට ඇතැයිද විශ්වාසයක් පවතී.

මෙම කරුණු නිසා හෝමෝ සේපියන් සහ නියැන්ඩර්තාල් මානවයන්ගේ පොදු පූර්වජයා ලෙස සැලැකෙන්නේ හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයායි.




හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයාගේ හිස් කබලක්

# ගවේෂණ

**9 වන කොටස**

සේපියන් මානවයන්ගේ ලක්‍ෂණ මෙන්ම නියැන්ඩර්තාල් මානවයන්ගේ ලක්‍ෂණ ද මෙම මානව විශේෂය සතුව ඇත. එමෙන්ම මෑතකාලීනව මයිටොකොන්ඩ්‍රියල් ජාන පදනම් කරගනිමින් සිදු කරන ලද පර්යේෂණ හරහා ද මෙම මතය තව දුරටත් තහවුරු වී තිබේ. හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා පරිණාමය වූයේ හෝමෝ ඇන්ටිසෙසර් මානවයා හරහා යැයි සමහර විද්‍යාඥයෝ




යා ජීවත් වන්නට ඇතැයි සලකන ප්‍රදේශ

අතීතයේ පැවසුව ද, නෙදර්ලන්ත ජාතික විද්‍යාඥ ෆ්‍රිඩෝ වෙල්කර් 2020 වසරේදී සිදු කළ පරීක්‍ෂණවලින් තහවුරු වූයේ එය එසේ නොවන බවයි.


පුද්ගලයන් 3,000ක් පදනම් කරගනිමින් 2023දී සිදු කරන ලද ජාන පර්යේෂණ හරහා පැමිණි එක් නිගමනයක් වන්නේ අදින් වසර ලක්‍ෂ 8-9 අතර කාලයේ ජීවත් වූ වත්මන් මානවයාගේ මුතුන්මිත්තන් ප්‍රමාණය 1,300ක් පමණ කුඩා අගයක් වන බවයි. එම සීමිත කණ්ඩායම පරිණාමය වීම හරහා ඊට ආසන්න කාලසීමාවකදී හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා බිහි වන්නට ඇතැයි අනුමානයක් පවතී.

මෙම මානවයන්ගේ හිස්කබල හෝමෝ ඉරෙක්ටස් මානවයන්ට සාපේක්‍ෂව බොහෝ සෙයින් හෝමෝ සේපියන් මානවයන්ට සමාන වේ. පුළුල් නළලකින් හෙබි හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානව හිස්කබල මොළයේ විශාලත්වය වැඩි විය හැකි පරිදි සැකැසී තිබිණි. සාමාන්‍යයෙන් කපාල ධාරිතාව ඝන සෙන්ටිමීටර 1,100ත් 1,390ත් අතර ප්‍රමාණයක් ගන්නා ලදී. එය බොහෝ සෙයින් නූතන මානවයා හා සමාන මට්ටමේ අගයකි. එමෙන්ම ශරීර ස්කන්ධයට සාපේක්‍ෂව සියයට 1.9ක ස්කන්ධයක් සහිත මොළයක් ඔවුන් සතු වන්නට ඇතැයි විශ්වාස කෙරේ.


මෙම මානවයන්ගේ චාර්වක දත් නූතන මානවයන්ට වඩා මඳක් විශාල වූ නමුදු මුල්කාලීන මානව වර්ගවලට සාපේක්‍ෂව කුඩා විය. එමෙන්ම තව දුරටත් දිගු හොම්බක් දැකිය නොහැකි වූ අතර, ශක්තිමත් හකුපාඩා සහිත විය. නාස් කුහරය සාපේක්‍ෂව විශාල විය.

පිරිමි හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයකු අඩි 5යි අඟල් 11ක් පමණ උස වූ අතර, ගැහැනු අයකු අඩි 5යි අඟල් 3ක් පමණ වන්නට ඇතැයි විශ්වාස කෙරේ. එමෙන්ම හෝමෝ අර්ගාස්ටර් මෙන් දිගු කකුල් ඔවුන් සතු විය. ඔවුන්ගේ අස්ථි අනුව පෙන්නුම් කෙරෙන්නේ හොඳින් වැඩුණු දේහයකට ඔවුන් හිමිකම් කියූ බවයි. මෙම මානව විශේෂයට අයත් පොසිල අතුරින් වයස්ගතම පුද්ගල පොසිලය වයස අවුරුදු 45කදී පමණ මිය ගිය පුද්ගලයකුට අයත් වේ. ඔහු යම් රෝගී තත්ත්වයන්ගෙන් පෙළී සිට ඇති බව පෙන්නුම් කෙරෙන අතර අනෙකුත් සමකාලීන මානවයන් ඔහු රැකබලා ගන්නට ඇතැයි විශ්වාස කෙරේ.

හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයන්ගේ ප්‍රධාන ආහාරය මස් වූ අතර, විශාල සතුන් දඩයම් කිරීමේ හැකියාවක් ඔවුන් සතු විය. මුවන්, රයිනෝසිරස්, ඌරන්, අලින් ඔවුන්ගේ ප්‍රධාන දඩයම් ඉලක්ක විය. එහෙත්, මෙම සතුන් තනිව දඩයම් කිරීමට නොහැකි වූ නිසාම ඔවුන් සාමූහික දඩයමට, සාමූහික ජීවිතයකට හුරු වන්නට ඇතැයි විශ්වාස කෙරේ. මස්වලට අමතරව යම් පමණකට ශාකමය ආහාර වර්ග ද ඔවුන් පරිභෝජනය කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.



**හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයාගේ හිස් කබලක් ආශ්‍රයෙන් නිර්මිත රුවක්**



**හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා භාවිතා කරන ලද ගල් අත්පොරොවක්**

භාෂාවක් කතා කළ හැකි මට්ටමට ඔවුන්ගේ ස්වරාලය සැකැසී ඇති අතර, සියුම් ශබ්ද වෙනස්කම් හඳුනාගත හැකි ලෙසට කන ද පවතින්නට

ඇතැයි විශ්වාස කෙරේ. එසේම ඊට ගැළපෙන ලෙස තර්කන ශක්තියක් ඔවුන් සතුව පවතින්නට ඇතැයි සාක්ෂි පවතින බැවින්, හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා මුල්කාලීන, ප්‍රාථමික භාෂාවක් සිය සන්නිවේදන කටයුතු සඳහා භාවිත

07 පිටුවට




# එක්සත් රාජධානියේ අධික ලෙස ඉහළ යන ජීවන වියදම

එක්සත් රාජධානියේ ජීවන වියදම් අධික ලෙස ඉහළ යාම හේතුවෙන් එරට ළමයින් ලක්ෂ 3කට අධික සංඛ්‍යාවක් දරිද්‍රතා තත්ත්වයකට ඇදදමා ඇති බව වාර්තා වේ. උද්ධමනය එහි සියයට 10ක උපරිම මට්ටමට පැමිණි 2022-23 වසර තුළ තවත් ලක්ෂ 6ක ජනතාවක් නිරපේක්ෂ දරිද්‍රතාවට ඇද දමා ඇති බව සංඛ්‍යාලේඛන පෙන්වා දෙන අතර, විචාරකයන් චෝදනා කරනුයේ එක්සත් රාජධානියේ දුප්පත්ම පවුල් ආරක්ෂා කිරීමට රජය අපොහොසත් වී ඇති බවය. ළමා දරිද්‍රතා ක්‍රියාකාරී කණ්ඩායමේ ප්‍රධාන විධායක



ඇලිසන් ගාර්න්හැම්



ෂෝනා ගෞඩි

ඇලිසන් ගාර්න්හැම් (Alison Garnham) පවසන්නේ මහ මැතිවරණ වර්ෂයකදී රටේ දුප්පත්ම දරුවන්ට වඩා හොඳ දේවල් කිරීමට වඩා අපගේ දේශපාලන නායකයන්ට කිසිවක් වැදගත් නොවිය යුතු බවය. නමුත් ළමා දරිද්‍රතාව වාර්තාගත ඉහළ මට්ටමකට පැමිණ තිබෙන අතර, ළමයින් මිලියන 4.3ක් දැන් සීතල නිවාසවල ජීවත් වෙමින් සහ ආහාර රහිත කුසවල්වලින් යුක්තව ජීවත් වන බවත් ය.

සමාජ, ආර්ථික සහ පාරිසරික යුක්තිය සඳහා වන 'නව ආර්ථික පදනම'ට (New Economics Foundation - NEF) අනුව පසුගිය දශකය තුළ (2014-15 සිට 2022-23 දක්වා) ළමා දරිද්‍රතාවේ විශාලතම වැඩිවීමක් ඇති වී තිබෙන එක්සත් රාජධානියේ ප්‍රදේශ තුන වන්නේ නොටින්හැම් (ළමයින්ගෙන් සියයට 40ක් දරිද්‍රතාවේ සිටිති), බර්මින්හැම් (සියයට 41) සහ ලෙස්ටර් (සියයට 41)ය. තිරසර ආහාර පද්ධතියක් සඳහා වන 'ආහාර පදනමෙහි' (The Food Foundation)හි ප්‍රතිපත්ති කළමනාකාරිනියක වන ෂෝනා ගෞඩී (Shona Goudie) පෙන්වා දෙන්නේ රජය ලබා දෙන වත්මන් ප්‍රතිලාභ මට්ටම් පැහැදිලිවම ප්‍රමාණවත් නොවන බවත්, ආහාර අනාරක්ෂිතභාවයේ අවදානම සහ දුර්වල ආහාර වේලක් අනුභව කිරීමේ සෞඛ්‍ය ප්‍රතිවිපාක ඉන් විශාල ලෙස ඉහළ නංවනු ලබන බවත්ය.

# මන්දපෝෂණයෙන් මිය යන ගාසාවේ ළමයින්

ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂක ජෙනරාල් ටෙඩ්රොස් අධනොම් (Tedros Adhanom) පවසන්නේ මන්දපෝෂණය, ලෙඩ රෝග, ජලය නොමැතිකම සහ සනීපාරක්ෂක පහසුකම් නොමැතිකම නිසා ගාසා තීරයේ වෙසෙන ළමයින් මිය යාමේ ප්‍රවණතාව දිනෙන් දින වර්ධනය වී ඇති බවත්, එය මුළුමහත් පරම්පරාවක්ම බරපතළ අනතුරක හෙළා ඇති බවත්ය. එම නිසා ඔහු ඊශ්‍රායලයෙන් ඉල්ලා සිටින්නේ ගාසා තීරය තුළට ජලය, ආහාර, වෛද්‍ය ආධාර ඇතුළු අනෙකුත් මානුෂීය ආධාර ලබා දීමට සහ ඒවා බෙදාහැරීමට අවස්ථාව ලබා දෙන ලෙසත්ය. කෙසේ නමුත්, පසුග ය ඔක්තෝබර් 7 සිට ගාසා තීරය තුළට එම මානුෂීය ආධාර රැගත් ට්‍රක් රථ ඇතුළුවීම ඊශ්‍රායලය විසින් පුළුල් ලෙස අවහිර කරනු ලැබ ඇති අතර, ඉතා කුඩා ප්‍රදේශයක පමණක් එය සිදු කිරීමට ඉඩ ලබා දී තිබේ.

ගාසා තීරයේ සෞඛ්‍ය බලධාරීන් පවසන්නේ සාගතය අත්‍යාසන්නයේ සිටින මිලියන 2.3කට ආසන්න ජනතාවට මෙම කුඩා ආධාර ප්‍රමාණය කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවය. මැයි මාසය වන විට උතුරු ගාසා තීරයේ සාගතයක් ඇති විය හැකි අතර, ජූලි මාසය වන විට එය ගාසාව පුරා පැතිර යා හැකි බව ඒකාබද්ධ ආහාර සුරක්ෂිතතා අදියර වර්ගීකරණය (IPC)ට අනුව හඳුනාගෙන තිබේ. අයි.පී.සී.ය පවසන්නේ උතුරු ගාසා තීරයේ සමහර ප්‍රදේශවල ජනතාවගෙන් සියයට 70ක් දරුණුතම ආහාර හිඟයෙන් පෙළෙන අතර, එය සාගතයක් ලෙස සැලකෙන සියයට 20 සීමාව මෙන් තුන්ගුණයකටත් වැඩි බවයි. සමස්තයක් වශයෙන් ගත් කල ගාසා තීරයේ පලස්තීනුවෝ මිලියන 1.1ක් එනම්, ජනගහනයෙන් අඩක් පමණ ආහාර හිඟය ව්‍යසනකාරී ලෙස අත්විඳිමින් සිටිති. ගාසා තීරයේ සෞඛ්‍ය අමාත්‍යාංශය පවසන්නේ ඊශ්‍රායලයේ ගුවන් හා ගොඩබිම් ප්‍රහාර නිසා අවම වශයෙන් පුද්ගලයන් 31,988ක් මිය ගොස් තවත් 74,188ක් තුවාළ ලබා ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කාන්තාවන් සහ ළමයින් වන බවයි.




ටෙඩ්රොස් අධනොම්



## මානව පරිනාමය පිළිබඳ.......

04 - 05 පිටුවෙන්



**හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා විසින් ඇතෙකුගේ අස්ථියක සිදුකරනු ලැබූ කැටයමක්**



**හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා විසින් භාවිතා කරනු ලැබූ හෙල්ලයක්**

කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

සතුන් මරා ගැනීමට මෙන්ම මස්කිරීමට භාවිත කරන ලද, පෙර මානව විශේෂයන් නිපැදවූ ගල් ආයුධවලට වඩා වඩාත් සියුම් ගල් ආයුධ මෙම මානව විශේෂය විසින් භාවිත කර ඇත. ඒවායේ මූලික ලක්ෂණ හෝමෝ අර්ගාස්ටර් මානවයන් විසින් භාවිතා කරන ලද ගල් ආයුධවලට සමානකම් දක්වයි. ගල් ආයුධවලට අමතරව සත්ව අස්ථි සහ ලීදඬුද ආයුධ ලෙස භාවිත කර ඇති බවට සාක්ෂි හමුව ඇති අතර, ගලින් නිපැදවූ හෙලි තුඩු සහිත හෙල්ලවල්ද හමුවී තිබේ. එය මීට පෙර සිටි වෙනත් මානව වර්ග විසින් භාවිත නොකරන ලද්දක් විය. මෙලෙස නිපැදවූ හෙල්ලක් පිළිබඳ පැරැණිතම සාක්ෂිය අදින් වසර ලක්ෂ 3ක් පමණ පැරැණිය.

හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයා ගින්දර භාවිත කර ඇති බවට සාක්ෂි පැවැතියද, ගින්දර පාලනයට දැනසිටි බව හෝ ආහාර පුළුස්සා හෝ පිස කෑමට ගත් බවට මෙතෙක් සාක්ෂි හමුව නැත. කෙසේ නමුත්, මෙම මානව විශේෂයට අයත් යුරෝපයේ සිටි මානවයන් සීතල කාලගුණ තත්ත්වයන්ට මුහුණ දීමට හෝ ගින්දර භාවිත කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. එමෙන්ම පැහැදිලි සාක්ෂි නොතිබුණද මෙම මානවයන් ඇඳුම් භාවිත කරන්නට ඇතැයිද අනුමානයක් පවතී. ඒ ද විශේෂයෙන් සීත කාලගුණයට ඔරොත්තු දීම සඳහා වේ.

මිනිසා විසින් ඉදිකරන ලද ගොඩනැගිලි පිළිබඳව මෙතෙක් සොයාගෙන ඇති පැරැණිතම සාක්ෂිය යුරෝපයේ චෙක් ජනරජයෙන් හමුවන අතර එය වසර ලක්ෂ 7ක් පමණ පැරැණි නිවසක අඩිතාලමකි. මෙය හෝමෝ හෙයිඩල්බජෙන්සිස් මානවයන් විසින් නිමවන්නට ඇතැයි සැකයක් පවතී.

එසේම කලා කෘති නිර්මාණයට මෙම මානවයන් උත්සාහ කරන්නට ඇතැයි පිළිගත හැකි සාක්ෂි හමුව ඇත. ඉන් එකක් වන්නේ අදින් වසර 3,50,000ක් පමණ පැරැණි කැටයම් කරන ලද අලියකුගේ පාද අස්ථියකි.

මෙම මානවයන් මිහිමත විසූ කාලය තුළ හෝමෝ ඉරෙක්ටස්, හෝමෝ නියැන්ඩර්තාල්, හෝමෝ සේපියන්, හෝමෝ නලේඩි යන මානව විශේෂද විවිධ ප්‍රදේශවල ජීවත්ව සිට ඇත.

(තවත් කොටසක් මීළඟ කලාපයෙන්...)

## බ්ලැන්කිවාදය යනු කුමක්ද? .......

08 - පිටුවෙන්

බොල්ෂෙවික් පක්ෂයක් යනු සමාජ පරිවර්තනයක් සඳහා පන්ති බලවේග සංවිධානය කළහැකි සහ ඒවා මෙහෙයවිය හැකි අයෝමය විනයකට යටත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මධ්‍යගත සංවිධානයකි. එය දෛනිකව සිදුවන දේශපාලන වෙනස්කම් මත උපක්‍රම වෙනස් කිරීමේ හැකියාවද එක් උපක්‍රමයක සිට වෙනස් උපක්‍රමයක් දක්වා මාරුවීමේ නම්‍යශීලීත්වයද සහිත ව්‍යාපාරයක් විය යුතු අතර එය කේඩරීය සීමාව ඉක්මවාගිය බහුජන ව්‍යාපාරයක්ද විය යුතුය.

බ්ලැන්වාදීන් අදහස් කරන ආකාරයට කුඩා කණ්ඩායමක් අතට රාජ්‍ය බලය ලබාගැනීම මගින් පුළුල් සමාජ පරිවර්තනයක් සිදුකල නොහැක. ධනවාදය ආර්ථික පදනමෙන් වෙනස් කොට ආර්ථිකයේ මෙන්ම සමාජ ජීවිතයේ ගැඹුරු වෙනස්කම් කිරීම සඳහා පුළුල් සමාජ බලවේගයන්ගේ කැමැත්ත තිබිය යුතුය. ඔවුන්ගේ අනුකූලතාවයකින් තොරව සිදුකරන කුමන්ත්‍රණකාරී ක්‍රියාදාමයක් ඔස්සේ මෙවැනි සමාජ පරිවර්තනයක් සිදුකිරීමට නොහැක. ඒ අන් කිසිවක් නිසා නොව සමාජයේ ප්‍රමුඛතම ගාමක බලවේග යන් වන කම්කරු පන්ති හා ගොවි ජනතාව සෘජුවම නිෂ්පාදන ක්‍රියාවලිය සමග සම්බන්ධවී සිටී. අපේක්ෂා කරන ගැඹුරු සමාජ පරිවර්ථනයක ප්‍රබල කොටස්කරුවන් වන්නේද ඔවුන්මය. අනෙක් පසින් සමාජවාදය යනු ධනවාදයේ සිට කොමියුනිස්ට් ක්‍රමය කරා යන සංක්‍රමනීය අවධියකි. මෙම අවධිය තුල විවිධ සමාජ ස්ථරයන්ගේ ප්‍රතිවිරෝධය අවම කරමින් පවත්වාගෙන යා හැක්කේද සාතිසය බහුතරයක් ජනතාවගේ අසීමිත විශ්වාසය පක්ෂය වෙත දිනා ගැනීමෙන් පමණි. මෙම යථාර්තයේ පවතින සත්‍යයෙන් බැහැරව කුමන්ත්‍රණකාරී කුඩා කණ්ඩායම්වලට මෙවැනි ගැඹුරු සමාජ පරිවර්ථනයක් ගැන සලකා බැලීමටවත් නොහැකිවනු ඇත.

# බ්ලැන්කිවාදය යනු කුමක් ද?

**බ්ලැන්කිවාදයේ නාමික උපත**

මෙම මතවාදය 19 වැනි සියවසේ මැදභාගයේ ප්‍රංශ නිර්ධන පන්ති ව්‍යාපාරය තුළින් (විශේෂයෙන් 1848-1871 කාලයේ දී) මතුවූ අවස්ථාවාදී ප්‍රවණතාවකි. මෙම මතවාදයේ නිර්මාපකයා වූයේ ලුවිස් ඔගස්ට් බ්ලැන්කි (**Louis Auguste Blanqui**)ය. එම වකවානුව තුළ ඔහු අනුගමනය කළ කුඩා කණ්ඩායමක් 'බ්ලැන්කිවාදී සමාජයක්' සංවිධානගත වී පැවැතී තිබේ.

**බ්ලැන්කිවාදය යනු:**


බ්ලැන්කිවාදය යනු රහසිගතව සංවිධානය වූ කුඩා කණ්ඩායමක් විසින් රාජ්‍ය බලය පැහැර ගැනීම මගින් සමාජවාදය ස්ථාපනය කළ හැකි යැයි විශ්වාස කරනු ලැබූ මතවාදයකි. එය විප්ලවය සඳහා පන්ති බලවේග සංවිධානය කිරීම ප්‍රතික්ෂේප කරයි.

**බ්ලැන්කිවාදය බිහි වීමට බලපෑ සමාජ පදනම**

ප්‍රංශයේ ධනේශ්වර විප්ලවයෙන් පසු ප්‍රංශය තුළ සමාජවාදී විප්ලවයක් සඳහා අවශ්‍ය විෂයමූල තත්ත්වය සම්පූර්ණ වෙමින් පැවැතිණි. නමුත්, නිර්ධන පන්තිය එවැනි විප්ලවීය පරිවර්තනයක් කිරීමට අවශ්‍ය පරිදි මතවාදීමය සහ සංවිධානමය වශයෙන් සූදානම් වී නොසිටියේය. පළමුවැනි ජාත්‍යන්තරය පවා නියෝජනය කළ බ්ලැන්කි, ධනපති පන්තියට එරෙහි විවේචනය ප්‍රබල ලෙස ඉදිරිපත් කළ ද, එම විවේචනය පිටුපස නිර්ධන පන්තිය සක්‍රිය ලෙස පෙළ නොගැසුණු තත්ත්වයක් තුළ විප්ලවය සඳහා මනෝරාජික ආකෘති පිළිබඳ යෝජනා කරළිගත විය.

**බ්ලැන්කිවාදය පිළිබඳව එංගල්ස්:**

**"ඔහුගේ දේශපාලනික ක්‍රියාකාරීත්වය තුළ ප්‍රධාන වශයෙන්ම ඔහු ක්‍රියාදාම**



**ලුවිස් ඕගස්ට් බ්ලැන්කි**

**මිනිසෙක්. හොඳින් සංවිධානය වූ කුඩා කණ්ඩායමක් අවස්ථාව ලද විට එල්ල කරන දේශපාලන ප්‍රහාරයකින් ආරම්භයේ දී ලබන සාර්ථකත්වයන් කිහිපයකින් ජනතාව ඔවුන් සමඟ පෙළගස්වා විප්ලවයක් සාර්ථක කළ හැකිය යැයි ඔහු විශ්වාස කළා. බ්ලැන්කිවරුන්ගේ තක්සේරුව අනුව කුඩා විප්ලවීය කණ්ඩායමකින් විප්ලවය කළ හැකි අතර, බලය ලබා ගැනීමෙන් පසු සෙසු පිරිස ඔවුන්ගේ ආඥාදායකත්වයට යටත් කළ හැකිය. මෙය සත්‍ය වශයෙන්ම ආඥාදායකත්වයක්. එහෙත්, එය සමස්ත නිර්ධන පන්තියේ ආඥාදායකත්වයක් නොව පුද්ගලයන් කිහිප දෙනකුගේ ආඥාදායකත්වයක් යටතේ සංවිධානය වූ කුඩා කණ්ඩායමක ආඥාදායකත්වයක් පමණි."**

(එංගල්ස් - බ්ලැන්කිවාදීන් කොමියුනයෙන් පලා යාම -1873.)

**බ්ලැන්කිවාදය හා බොල්ෂෙවික්වාදය**

රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා නිර්ධන පන්තිය පක්ෂයක් ලෙස සංවිධානය වේ. එම පක්ෂයට පන්ති අධිකාරී බලයක් සහිත නායකත්ව මණ්ඩලයක් විසින් නායකත්වය සපයනු ලැබේ. මෙම බොල්ෂෙවික් සංවිධාන ව්‍යුහය විකෘති ලෙස අර්ථදක්වමින්, එය ද පුද්ගල කණ්ඩායමක් වෙත රාජ්‍ය බලය ලබා ගැනීමක් ලෙස අර්ථගැන්වීමට අවස්ථාවාදීන් විසින් උත්සාහ දරනු ලැබූ අවස්ථා තිබේ. වරෙක ප්ලෙහානොව් සහ ඇතැම් මෙන්ෂෙවිකයෝ බොල්ෂෙවිකයන් බ්ලැන්කිවාදීන් ලෙස අර්ථගැන්වීමට ද උත්සාහ කළහ.

මේ පිළිබඳව රෝසා ලක්සම්බර්ග් දීර්ඝ ලෙස පිළිතුරු සපයා ඇත.

**"සවිඥානික සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සහ බ්ලැන්කිවාදීන් අතර වෙනස වන්නේ කුමන්ත්‍රණකරුවන් පිරිසක් වෙනුවට අපට නිර්ධන පන්තියක් සිටීම ය. පන්තිය සංවිධානය කිරීම පිළිබඳ අපගේ අදහස අමතක කර දමන ඔහු මධ්‍යගතභාවය සහ පක්ෂයේ අරගල අතර සම්බන්ධතාව පිළිබඳ අපගේ අදහස පිළිබඳ විකෘති අදහසක් පළ කරයි. වැඩ කරන ජනතාවගේ ක්‍රියාකාරීත්වය බ්ලැන්කිවාදීහු අපේක්ෂා නොකරති. විප්ලවය සඳහා ඔවුන්ට ජනතාව සෘජුව සංවිධානය කිරීමට අවශ්‍ය නැත. ඔවුන් ජනතාවගෙන් අපේක්ෂා කරන්නේ විප්ලවීය මොහොතේ ක්‍රියාකාරීත්වයක් පමණි."**

මාක්ස්වාදීන් වන අප විසින් මෙම අවස්ථාවාදී ප්‍රවණතාව මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනු ලබන අතර, සමාජ පරිවර්තනයක් සඳහා විප්ලවයේ මිතුරු බලවේග සියල්ල බොල්ෂෙවික් පක්ෂයක් කේන්ද්‍ර කර ගත් පුළුල් බහුජන ව්‍යාපාරයක් වටා සංවිධානය කිරීම පිළිගනු ලබයි.

07 පිටුවට



**''දස ලක්ෂ ගණන් හා කෝටි ගණන් ජනතාවගේ පුරුද්දෙහි ශක්තිය අතිමහත් බලවේගයක් වන්නේය. අරගලයෙන් පන්නරයලත් අයෝමය පක්ෂයකින් තොරව අදාළ පන්තියේ සියලු අවංක ජනතාවන්ගේ විශ්වාසය දිනාගත් පක්ෂයකින් තොරව, පොදු ජනතාවගේ අන්දම් ගැන පරීක්ෂාවෙන් සිටීමේ හා ඒවා කෙරෙහි බලපෑමේ පොහොසත්කම් ඇති පක්ෂයකින් තොරව එවැනි අරගලයක් සාර්ථක ලෙස කළ හැක නොවේ''**

ලෙනින් තෝරාගත් කෘති 10 වෙළුම 157 පිටුව